සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்புக் கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

# දෙවන වාර ඇගයීම - 2016
# இரண்டாம் தவணை மதிப்பீடு - 2016
# Second Term Evaluation - 2016

10 ශ්‍රේණිය
தரம் 10
Grade 10

## පුරවැසි අධ්‍යාපනය I පත්‍රය
## குடியுரிமைக் கல்வி வினாத்தாள்-I
## Citizenship Education Paper I

පැය එකයි
ஒரு மணித்தியாலம்
One Hour

නම :- ...................................................................... විභාග අංකය :- ..............................................

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට ප්‍රශ්න පත්‍රය තුළ ම පිළිතුරු ලියන්න.
ii. පිළිතුරු ලිවීමේ දී පෑන පමණක් භාවිතා කරන්න.
iii. පිළිතුරු පත් ඇගයීමේ දී පැහැදිලි අත්අකුරු හා පිරිසිදු බව පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් වේ.
iv. දී ඇති උපදෙස් අනුව ම පිළිතුරු ලිවිය යුතුයි.

---

- ප්‍රශ්න අංක 1 සිට10 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු අංකය තෝරා වරහන තුළ ලියන්න.

1. වර්තමානයේ දී සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමට නොහැකි ගැටලුවකි,
   i. වර්තමානයේ රාජ්‍යයන් භූමිය අතින් කුඩා වීම.
   ii. සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම.
   iii. ජනගහනය ක්‍රමයෙන් කුඩාවීම.
   iv. සියලු ජනතාව එක් තැනකට රැස් කිරීමට රාජ්‍යයන් තුළ ඉඩකඩ තිබීම. (..........)

2. "බාහිර බාධකයන්ගෙන් තොර ව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්තාව නිදහසයි" යනුවෙන් ප්‍රකාශ කළේ,
   i. ඒබ්‍රහම් ලින්කන්     iii. සීලර්
   ii. ජී. ඩී. එච්. කෝල්     iv. මහාචාර්ය අයිවර් ජෙනිංග්ස් (..........)

3. තරඟකාරී පක්ෂ ක්‍රමය යනු,
   i. බහුවිධතාව තුළින් එක්සත් බව ගොඩනගයි.
   ii. ජනමතය නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් නොවේ.
   iii. මේ නිසා ජනසමාජයේ පවතින විවිධත්වය නිරූපණයට ඇති ඉඩ ඇහිරේ.
   v. ආණ්ඩු පක්ෂය විවේචනය කිරීම නිසා සමාජයට අහිතකර තත්වයක් ඇති වේ. (..........)

4. මැතිවරණයක් නිදහස් හා සාධාරණ වීමට නම්,
   i. නියමිත කාල සීමාව තුළ ම පැවැත්විය යුතු නොවේ.
   ii. සුදුසුකම් සපුරා තැනත් අවස්ථාව අනුව ඡන්දය ප්‍රකාශ කිරීමට දිය යුතු ය.
   iii. මැතිවරණ කටයුතුවලට සහභාගි වීමේ අයිතිය තහවුරු වී තිබිය යුතු ය.
   vi. අදාළ ඡන්දය අනුව මැතිවරණ නීතිරීති වෙනස් කර ගත හැකි විය යුතු ය. (..........)

5. නිදහස් මාධ්‍ය පවතින රටක,
   i. සත්‍ය හා නිවැරදි තොරතුරු ජනතාවට දැන ගැනීමේ හැකියාව තිබිය යුතු ය.
   ii. ව්‍යාපාර අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා තොරතුරු දැමීම කළ යුතු ය.
   iii. ජනතාවගේ දුක් ගැනවිලිවලට එතරම් අවධානයක් යොමු කළ යුතු නැත.
   iv. ආණ්ඩුව විවේචනය කිරීම නොකළ යුතු දෙයකි. (..........)

6. ස්වාධිපති බලය යනුවෙන් දක්වන්නේ,
   i. රටවල් වෙනුවෙන් ම යෙදවිය හැකි බලයකි.
   ii. ජනතාව වෙනුවෙන් යෙදවිය හැකි අධිකාරී බලයයි.
   iii. එය බාහිර බලවේගයක මැදිහත් වීමකින් තොර ව පමණක් යෙදවිය හැක.
   iv. එය අභ්‍යන්තර බලවේගයක මැදිහත් වීමකින් තොර ව පමණක් යෙදවිය හැක. (..........)

7. ව්‍යවස්ථාදායකය,
   i. නීති ක්‍රියාත්මක කිරීමේ බලය භුක්ති විඳියි.
   ii. යුක්තිය පසිඳලීමේ කටයුතුවල නිරත වෙයි.
   iii. ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමට බැඳී නැත.
   iv. නීති පැනවීමේ කාර්යය ඉටු කරනු ලබයි. (..........)

8. ජනාධිපති ආණ්ඩුක්‍රමයක් පවතින රටක,
   i. සෘජු ව ජනාධිපති පාර්ලිමේන්තුවට වගකිව යුතු ය.
   ii. ජනාධිපතිවරණයකින් තේරී පත් වේ.
   iii. ව්‍යවස්ථාදායකය විසින් පත් කරනු ලබයි.
   iv. රාජ්‍ය නායකයා අගමැති වන අතර, ජනාධිපති ආණ්ඩුවේ නායකයා වේ. (..........)

9. යහපත් සමාජයක් ගොඩනැංවීමට, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියා සතුව යහපත් ගුණාංග තිබිය යුතු ය. ඉන් එකකි
   i. විරුද්ධ මත විවේචනය කළ යුතු ය.
   ii. බහුතර මතයට විරුද්ධ වීමේ හැකියාව ප්‍රගුණ කළයුතු ය.
   iii. සහයෝගයෙන් කටයුතු කළ යුතු ය.
   iv. අයිතීන් භුක්ති විඳීමේ දී, යුතුකම් ගැන සැලකිලිමත් වීම අනවශ්‍ය දෙයකි. (..........)

10. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක යහපත් සාමකාමී සමාජයක් ගොඩනැංවීමට නම්,
   i. නීතියේ ආධිපත්‍ය අත්‍යවශ්‍ය ම නොවන කරුණකි.
   ii. බහුතර මතයට අනුව ම කටයුතු කළ යුතු නැත.
   iii. සුළුතරයේ අදහස් එතරම් ගරු කළ යුතු නොවේ.
   iv. සාකච්ඡා මගින් තීරණවලට එළඹීම කළ යුතු දෙයකි. (..........)

- අංක 11 සිට 20 දක්වා ප්‍රශ්නවලට නොගැළපෙන පිළිතුර තෝරා වරහන තුළ ලියන්න.

11. ව්‍යවස්ථාදායක මණ්ඩලයේ කාර්යයන් නම්,
   i. නීති සම්මත කිරීම, විධායකය පාලනය කිරීම, ජනතා ප්‍රශ්න සාකච්ඡා කිරීම.
   ii. නීති සම්මත කිරීම, අයවැය පාලනය, විධායකය පාලනය කිරීම.
   iii. මුදල් පාලනය, විධායකය පාලනය කිරීම, ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම.
   iv. විධායකය පාලනය, නීති සම්මත කිරීම, ආණ්ඩුකාරවරුන් පත්කිරීම. (..........)

12. රාජ්‍යයකට පැවරෙන කාර්යයන් නම්
   i. සමාජ සුභසාධන සේවාවන් සැපයීම.
   ii. අන් රාජ්‍යයන් යටත් කර ගැනීමට කටයුතු කිරීම.
   iii. පොදු සේවා පවත්වා ගෙන යාම.
   iv. දිළිඳුකම තුරන් කිරීමට කටයුතු කිරීම. (..........)

13. ඒකීය රාජ්‍ය,
   i. බලය විමධ්‍යගත කිරීම සිදුකරයි
   ii. ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවකින් පමණක් හසුරුවයි.
   iii. බලය බෙදා හැරීම මෙහි ලක්ෂණයකි.
   iv. විමධ්‍යගත කරන ලද බලතල ඕනෑ ම අවස්ථාවක ආණ්ඩුවට නැවත පවරා ගත හැක. (..........)

14. සන්ධීය රාජ්‍ය,
   i. බලය බෙදා හැරීම එහි ප්‍රධාන ලක්ෂණයකි.
   ii. මධ්‍යම ආණ්ඩුවක් හා ප්‍රාදේශීය ආණ්ඩු ක්‍රියාත්මක වේ.
   iii. ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇත.
   iv. මෙහි බොහෝ විට දෙවන මණ්ඩලයක් දක්නට නැත. (..........)

15. ශ්‍රී ලංකාවේ පළාත් සභා,
   i. 1978 ආණ්ඩුක්‍රමයේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් හඳුන්වා දෙන ලදි.
   ii. මෙය හඳුන්වා දීම නිසා වාර්ගික අර්බුද නිර්මාණය විය.
   iii. ශ්‍රී ලංකාවේ පළාත් සභා 09ක් ක්‍රියාත්මක වේ.
   iv. ජනාධිපති විසින් පළාත් සභාවලට ආණ්ඩුකාරවරුන් පත්කරයි. (..........)

16. ආණ්ඩුකාරතුමා සතු බලතලයක් නොවන්නේ,
   i. පළාත් සභාවේ ප්‍රධාන විධායක ලෙස ක්‍රියා කරයි.
   ii. පළාත් සභාව ඇමතීම හා සන්දේශ යැවීම කළ හැක්කේය.
   iii. පළාත් සභා ප්‍රඥප්තීන් අනුමත කළ හැකි ය.
   iv. ප්‍රධාන ඇමති හා අමාත්‍ය මණ්ඩලය පත් කරනු ලබයි. (..........)

17. මහ ඇමති හා අමාත්‍ය මණ්ඩලය සතු බලතල
   i. පළාත් ආණ්ඩුකරුට උපදෙස් ලබාදෙයි.
   ii. පළාත් අයවැය ලේඛනය සකස් කරයි.
   iii. ආණ්ඩුකාරතුමා පත් කරනු ලබයි.
   iv. පළාතේ ආර්ථික සංවර්ධනය ක්‍රියාත්මක කරයි. (..........)

18. පළාත් පාලන ආයතන,
   i. ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල මේවාට බෙදා ඇත.
   ii. මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන කටයුතු පහසු කර ගැනීමට පිහිටුවා ඇත.
   iii. මහ නගර සභා, නගර සභා, ප්‍රදේශීය සභා වශයෙන් ක්‍රියාත්මක වේ.
   iv. මේවාට බලය විමධ්‍යගත කරනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි. (..........)

19. ඇමරිකා එක්සත් ජනපද සන්ධිය රාජ්‍යය,
   i. ජනපද 13කින් ආරම්භ විය.
   ii. වර්තමානයේ ප්‍රාන්ත 50කින් සමන්විතයි.
   iii. ක්‍රි.ව. 1787 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගන්නා ලදි.
   iv. බොහෝ රටවල් මෙන් ඇමරිකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයට අයත් නොවීය. (..........)

20. ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යුහය
   i. මධ්‍යම හා ප්‍රාන්ත ආණ්ඩු අතර ගැටලු මතු වුවහොත් එය විසඳීමට ශ්‍රේෂ්ඨාධිකරණයට බලය නොමැත්තේ ය.
   ii. විධායක ජනාධිපතිවරයෙක් විධායක බලය ක්‍රියාත්මක කරයි.
   iii. ද්වි මාණ්ඩලික වේ.
   iv. ජනාධිපති විසින් සමහර බලතල ක්‍රියාත්මක කිරීමේ දී සෙනෙට් සභාවේ අනුමැතිය ලබාගත යුතු ය. (..........)

- **අංක 21 සිට 30 දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ හතරෙන් තුනක් <u>නිවැරදි ය</u>. එම නිවැරදි පිළිතුරු අංකය තෝරා වරහන තුළ ලියන්න.**

21. ඡන්දදායකයෙකු සතු අයිතීන්,
   A – ඡන්දය පාවිච්චි කිරීම.
   B – මන්ත්‍රී අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වීම.
   C – අන් අය ද තම මතය සඳහා පොළඹවා ගැනීම.
   D – මැතිවරණ ප්‍රචාරක රැස්වීම් ඇමතීම. (..........)
   i. ABC   ii. ABD   iii. ACD   iv. BCD

22. පුද්ගලයන් සතු අයිතිවාසිකම් නම්,
   A – සාමකාමී ව එක් රැස්වීමට ඇති අයිතිය.
   B – තමාට අභිමත පරිදි රිය පැදවීමේ අයිතිය.
   C – අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය.
   D – වැඩ කිරීමට හා සමාන වැඩ සඳහා සමාන වැටුප් ලබා ගැනීමේ අයිතිය. (..........)
   i. ABC   ii. ABD   iii. ACD   iv. BCD

23. රටක නීතියේ ආධිපත්‍ය පවතී නම්,
   A – සැමවිට නීතියට ගරු කරනු ලබයි.
   B – නීති අභිභවා නොයයි.
   C – නීතිය ඉදිරියේ සමානාත්මතාව දක්නට ලැබේ.
   D – නීතියේ රැකවරණය පිළිබඳ ගැටලු සහගත තත්ත්වයන් දක්නට ලැබේ. (..........)
   i. ABC   ii. ABD   iii. ACD   iv. BCD

24. නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතු වූයේ,

A – විවිධත්වය තුළ එක්සත්කමක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාව.

B – රාජ්‍යයේ විශාලත්වය පාලන කටයුතු කිරීමට අපහසුවීම නිසා.

C – අධිරාජ්‍යයන් බිහි කර ගැනීමේ පහසුව සඳහා.

D – ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා. (.........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

25. බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ,

A – විවිධ ජන වර්ග එකට ජීවත් වීම.

B – එක ජන කොටසක වුව ද ප්‍රාදේශීය ව විවිධත්වයක් දැකිය හැකි වීම.

C – ගෝලීයකරණය, සන්නිවේදන තාක්ෂණයේ දියුණුව මෙයට බාධා පැමිණ වීම.

D – ජාතීන්ංවශයෙන් දේශ සීමාවලින් ඔබ්බට ගොස් විවිධ ජාතීන් සමග සම්මිශ්‍රණය වීම ඉතා වේගයෙන් සිදුවීම. (.........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

26. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට ආක්‍රමණ බලපා ඇත. එ‍ා ආක්‍රමණ නම්,

A – පඬුවස් දෙව් ඇතුළු පිරිස.

B – පණ්ඩු පාරින්ද ඇතුළු පිරිස.

C – බටහිර යුරෝපීය ජාතීන්ගේ පැමිණීම.

D – කාලිංග මාඝ පැමිණීම. (.........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

27. සමාජ සාධාරණත්ව ගොඩනැගීම බිඳ වැටීමට හේතු වන්නේ,

A – රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂම භාවය.

B – රාජ්‍ය පාලකයින් වගකීමෙන් යුතු ව කටයුතු කිරීම.

C – රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම.

D – අල්ලස් හා දූෂණය ඉහළ යාම. (.........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

28. යහපාලනයක් සාර්ථක වීමට සමාජ හා සංස්කෘතික අනන්‍යතාවන්ට ගරු කළ යුතු ය. එම සමාජ හා සංස්කෘතික අනන්‍යතාවන් නම්,

A – කැමති ආගමක් ඇදහීම.

B – විවිධ උත්සව පැවැත්වීම.

C – අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.

D – ප්‍රධාන ජාතියේ සිරිත්විරිත් පමණක් ඇදහීම. (.........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

29. බහු සංස්කෘතික සමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියන් ඉටු කළ යුතු ගුණාංග ඇත. එනම්,

A – අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම.

B – ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම.

C – අන්‍ය මත සමග නිතර ගැටුම් ඇතිකර ගැනීම.

D – සාමූහිකත්වය වර්ධනය කිරීම. (.........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

30. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත් ව කටයුතු කිරීමෙන් ඇති වන යහපත් තත්ත්වයන් නම්,

A – ගැටුම් අවම වේ

B – අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය වර්ධනය නොවේ

C – මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ.

D – ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ. (..........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

- **ප්‍රශ්න අංක 31 සිට 40 දක්වා ප්‍රශ්නවල ප්‍රකාශ හතරක් ඇත. එම ප්‍රකාශ හතරෙන් ප්‍රශ්නයට අදාළ වන්නේ එක් ප්‍රකාශයකි. <u>අදාළ නොවන</u> ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.**

31. යහපාලනය සාර්ථක වීමට නම් රටක දේශපාලනය තුළ නොතිබිය යුතු ගුණාංග අතර

A – තමන් කැමති දේශපාලන මතයක් දැරීම.

B – දේශපාලන නායකත්වය ගරු කිරීම අවශ්‍ය නැත.

C – තමන් කැමති දේශපාලන මතවාදයක් දැරීමට හැකි විය යුතු නැත.

D – නිදහස් හා සාධාරණ මැතිවරණ අනවශ්‍ය වේ. (..........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

32. බහු සංස්කෘතික සමාජයක් වීමට ලංකාවේ පිහිටීම වැදගත් වී ඇත. ඒ පිහිටීම අතර වැදගත් වන්නේ නැති කාණ්ඩ කුමක් ද ?

A – භූගෝලීය පිහිටීම අදාළ නැත. B – ඉන්දියාවට ආසන්න නොවීම.

C – වෙළඳ මධ්‍යස්ථානයක් නොවීම. D – ඉන්දියන් සාගරයේ මධ්‍යගත ව පිහිටීම. (..........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

33. ශ්‍රී ලංකාවේ කුඩා ම පළාත අයත් නොවන කාණ්ඩය වන්නේ,

A – වයඹ B – බස්නාහිර C – මධ්‍යම D – ඌව (..........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

34. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට අයත් නොවන කාණ්ඩය නම්,

A – මහ නගර සභා, නගර සභා, රට සභා.

B – රට සභා, නගර සභා, පළාත් සභා.

C – පළාත් සභා, මහ නගර සභා, ප්‍රාදේශීය සභා.

D – මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා. (..........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

35. සර්ව ජන ඡන්ද බලයට අනුව ඡන්දය දීමට නුසුදුසු කාණ්ඩය තෝරන්න.

A – .ස්ත්‍රී / පුරුෂ වයස් පරතරයක් තිබිය යුතු ය.

B – පරම්පරාව කැමති පක්ෂයකට ඡන්දය දිය යුතු ය.

C – අවු. 18 ඉක්ම වූ ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයට ම ඡන්ද බලය හිමිවේ.

D – ස්වාධීන අපේක්ෂකයන්ට ඡන්ද බලය නැත. (..........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

36. ප්‍රබල ජාතික රාජ්‍යයක් ඇතුළත් නොවන කාණ්ඩය නම්

A – ලංකාව B – ස්වාසිලන්තය C – මැලේසියාව D – ප්‍රංශය (..........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

The National e-Learning Portal for The General Education

37. මූලික ආර්ථික ප්‍රශ්න නොවන කාණ්ඩය තෝරන්න.

A – කුමක්, කොපමණ නිෂ්පාදනය කරන්නේ ද ?

B – නිෂ්පාදන භාණ්ඩවල ගුණාත්මක භාවය කෙසේ විය යුතු ද ?

C – යොදාගන්නා ශිල්ප ක්‍රමය අදාළ කර ගත යුතු නැත.

D – නිෂ්පාදනය කරන්නේ කවුරුන් ද ? (..........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

38. ආර්ථික නොවන භාණ්ඩ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

A – ජලය B – ඖෂධ C – හිරු එළිය D – වාතය (..........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

39. කාර්මික නිෂ්පාදනවලට අදාළ නොවන අංගය නොවන්නේ,

A – තේ B – බිත්තර C – මෝටර් රථ D – පොල් (..........)

i. ABC ii. ABD iii. ACD iv. BC

40. මිශ්‍ර ආර්ථිකයක ලක්ෂණ නොවනුයේ,

A – නිෂ්පාදන සාධකවල අයිතිය රජය සතුවීම.

B – නිෂ්පාදන සාධකවල අයිතිය පෞද්ගලික අංශය සතුවීම.

C – ශුභසාධක කටයුතු පෞද්ගලික අංශය මගින් ඉටු කිරීම.

D – ශුභසාධක කටයුතු කිරීමට රජය මැදිහත් වීම. (..........)

i. ABC ii. ABD iii. ACD iv. BCD

e තක්සලාව The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்புக் கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

- 2016

| 10 ශ්‍රේණිය<br>தரம் 10 | පුරවැසි අධ්‍යාපනය II පත්‍රය<br>குடியுரிமைக் கல்வி மற்றும் சமூக நிர்வாகம் விடைத்தாள்- II<br>Citizenship Education Paper II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |
|---|---|---|

සැලකිය යුතුයි

I. පළමු වන ප්‍රශ්නය අනිවාර්යය වේ.
II. පළමු වන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න 05කට පිළිතුරු ලියන්න.

1.

I. සප්ත අපරිහානි ධර්ම දෙකක් ලියන්න. (ලකුණු 02)

II. බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් ලියන්න. (ලකුණු 02)

III. පුරවැසි අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

IV. ජනාධිපති ආණ්ඩු ක්‍රමයේ විශේෂ ලක්ෂණ දෙකක් දක්වන්න. (ලකුණු 02)

V. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කොට ඇති ආයතන දෙකක් ලියන්න. (ලකුණු 02)

VI. ඒකීය රාජ්‍යයක ලක්ෂණ පිළිබඳ ව මත ඉදිරිපත් කළ දෙදෙනෙකුගේ නම් ලියන්න. (ලකුණු 02)

VII. ශ්‍රී ලංකාවේ කුඩා ම පළාත දක්වා එයට අයත් දිස්ත්‍රික්කයක් නම් කරන්න. (ලකුණු 02)

VIII. ජන සමාජයේ දක්නට ලැබෙන සියලු ම බලවේග මෙහෙය වන ලක්ෂණ සංස්කෘතියට අයත් ය. එම ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

IX. දෙමළ ජනතාව අදහන අගම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

X. නිෂ්පාදනය සඳහා යොදාගන්නා ශිල්ප ක්‍රම දෙක කුමක් ද ? (ලකුණු 02)

(මුළු ලකුණු 2 x 10 = 20)

2.

I. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ව අදහස් දක්වා ඇති දේශපාලන විද්‍යාඥයින් දෙදෙනෙකුගේ නම් සඳහන් කරන්න. (ලකුණු 02)

II. ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත් වන ආකාරය දැක්වීමට උදාහරණ තුනක් සපයන්න. (ලකුණු 03)

III. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ තුනක් ලියා, ඉන් එකක් පිළිබඳ ව පැහැදිලි කරන්න. (ලකුණු 05)

3.

I. ද්වි පක්ෂ ක්‍රමය තිබෙන රටවල් 02ක් නම් කරන්න. (ලකුණු 02)

II. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ 03ක් ලියන්න. (ලකුණු 03)

III. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ තුනක් ලියා, ජනාධිපති පත් වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05)

4.

I. ඒකීය ආණ්ඩු ක්‍රමයක් පවතින රටක් හා සන්ධීය ආණ්ඩු ක්‍රමයක් පවතින රටක් ලියන්න. (ලකුණු 02)

5.

I. පළාත් සභාවක පත්කළ විධායකය හා ඡන්දයෙන් පත් වූ දේශපාලන විධායකය වශයෙන් විධායකයන් දෙකක් ක්‍රියාත්මක වේ. එම විධායකයන් දෙක සඳහන් කරන්න. (ලකුණු 02)

II. ආණ්ඩුකාරතුමා සතුවන බලතල හා කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

III. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් සභා සතු බලතල හා කාර්යයන් ලැයිස්තු 03ක් යටතේ දක්වා ඇත. එම ලැයිස්තු 03 සඳහන් කර ඉන් එකක් පිළිබඳ ව විස්තර කරන්න. (ලකුණු 05)

6.

I. "ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට අතීත වෙළඳාම ද හේතු වී ඇත." ලංකාවට වෙළෙඳාම සඳහා පැමිණි ජාතිකයන් දෙවර්ගයක් සඳහන් කරන්න. (ලකුණු 02)

II. යහපාලනයක් සාර්ථක වීමට අවශ්‍ය සමාජ හා සංස්කෘතික ගුණාංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

III. බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් ලැබෙන යහපත් ප්‍රතිඵල තුනක් ලියා, ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

7.

I. මූලික ආර්ථික ප්‍රශ්න 02ක් ලියන්න. (ලකුණු 02)

II. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන අංශ 03ක් ඇත. එම තුන් වර්ගය සඳහන් කරන්න. (ලකුණු 03)

III. "ආර්ථිකයක විවිධ ක්‍රියාවලියන් සිදුවේ. එම ක්‍රියාවලියන් ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැක." එම කොටස් තුන සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

இரண்டாம் தவணைப் பரீட்சை - 2016

| | | |
|---|---|---|
| 10 ශ්‍රේණිය<br>தரம் 10 | පුරවැසි අධ්‍යාපනය II පත්‍රය<br>குடியுரிமைக் கல்வி - II<br>Citizenship Education Paper II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

මුස්ලිම් පාසල් සඳහා උපදෙස්

- දෙවන කොටසේ ප්‍රශ්න තෝරා ගැනීමේ දී ප්‍රශ්න අංක 8 හා 9 ප්‍රශ්න ද පිළිතුරු ලිවීමට තෝරා ගන්න.

8.

I. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ස්වරූප දෙක ලියන්න. (ලකුණු 02)

II. නූතන රාජ්‍ය තුළින් පක්ෂ ක්‍රමයේ ස්වරූප තුනක් හඳුනාගත හැකි ය. එම තුන සඳහන් කරන්න. (ලකුණු 03)

III. නීතියේ ආධිපත්‍ය පවතින බව විදහාපාන ලක්ෂණ තුනක් ලියන්න. ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

9.

I. සන්ධීය ආණ්ඩුක්‍රම පවතින රටවල් 02ක් දක්වන්න. (ලකුණු 02)

II. පළාත් සභාවක මහ ඇමති හා අමාත්‍ය මණ්ඩලය සතු බලතල හා කාර්යයන් 03ක් සඳහන් කරන්න. (ලකුණු 03)

III. පළාත් සභාවට අයත් III තුන්වන ලැයිස්තුවේ (සමගාමී ලැයිස්තුවේ) දැක්වෙන බලතල තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)